සබරගමු පළාත් අධ්‍යාපනදෙපාර්තමේන්තුව

2 ශ්‍රේණිය - ජූලි තුන්වන සතිය

විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා කාර්ය පත්‍රිකාව

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

සැකසුම - ජී.කේ.එස්.කේ.ජයවීර මිය, කෑ/දෙහි/මුහන්දිරම් විද්‍යාලය, දැරණියගල.

<u>පුංචි නිවේදිකාවක් නිවේදකයෙක් වෙමු.</u>

* ස්ලෝන් බට කෑල්ලක් නැතිනම් කුඩා ලීයකට කොළ බෝලයක් ඔතලා මයික් එකක් හදාගන්න.
* වැටෙන්නේ නැති විදිහට පුටුවකට නගින්න.
* ගෙදර අයට ඇහෙන්න පහළ තියෙන නිවේදනය ලස්සනට කියන්න.
  "ආයුබෝවන් අම්මේ, තාත්තේ ,
  අද මම ඔයාලා ආසම කරන වැඩසටහන අරගෙන ඔබේ ආලින්දයට ඇවිත් ඉන්නේ. ඉතිං අපි හැමෝම අද මේ පොඩ්ඩන්ගේ දක්ෂතාවයන් කොහොමද කියලා බලමු. මුලින්ම අද ගීත තාරකාව තරඟයට එක්වෙන අපේ පොඩ්ඩෝ හයදෙනාවයි, විනිසුරු මඩුල්ලයි ආදරයෙන් පිළිගන්නවා. මුලින්ම මියුරු ගීතය ගයන්නට මම ආරාධනා කරනවා ..... " (කියලා ඔයාලගේ ගෙදර කෙනෙක්ගේ නම කියන්න.)
* මේවගේ ඒවා තව තව කරන්න. ඒවගේ වීඩියෝ ටීචටත් යවන්න.
* මේ කුසලානය ඔයාලගේ හැකියාවට හොඳේ.